ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමකට බොහෝ විට වෙනත් දිවි තොර කරගැනීමේ සිදුවීමකට වඩා ඉහළ අවධානයක් ලැබෙනා බැවින්, ඝාතන-දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය වඩාත් ප්‍රවේසම් සහගත හා ආචාර ධාර්මික විය යුතු බව, දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් පෙන්වා දෙයි.

අප්‍රේල් 24, 2022 දින වැබඩ දී සිදුවූ ඝාතන-දිවි තොර කරගැනීමට තැත් කිරීමේ සිදුවීමක් සම්බන්ධයෙන් මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබූ ආකාරය මෙහිදී නිදසුන් ලෙස ගත හැක. විශේෂයෙන්ම, අප්‍රේල් 26, 2022 දින දිනමිණ පුවත්පතේ එය වාර්තා කර තිබූ ආකාරය සහ එහිදී කඩවී තිබූ මාධ්‍ය මාර්ගෝපදේශයන් මෙසේ දැක්විය හැක.

1) ප්‍රමුඛතාවයෙන් යුතුව පළ කොට ඇත.

2) දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරය දක්වා ඇති අතර, දීර්ඝ ලෙස විස්තර කොට ඇත.

3) උපකාරක අංක සඳහන් කර නැත.

4) භාවාතිෂය ලෙසින් වාර්තා කර ඇත: මෙහිදී ඝාතනයට ලක්වූ කාන්තාවගේ ඡායාරූපයක්ද පළ කරමින්, ඇය "රූමත්" බවට පුවත් සිරස්තලයේ ඉස්මතු කර ඇත. එසේ නම්, ඝාතන-දිවි තොර කරගැනීමට තැත් කිරීම පිළිබඳ පුවතකට, ඝාතනයට ලක්වූ අයගේ බාහිර රූපය අදාළ වන්නේ කෙසේදැයි පාඨක අප ප්‍රශ්න කළ යුතුයි. එසේම මෙවැනි සිදුවීම් භාවාතිෂය ලෙසින් දැක්වීම ඔස්සේ, දිවි තොර කරගැනීමට නැඹුරුවක් ඇති තවත් අයෙකු තමන්ව ඒ හා අනන්‍ය කර ගැනීම සිදුවිය හැක.

ඝාතන-දිවි තොර කරගැනීම් වාර්තා කිරීමට පිළිබඳ මාර්ගෝපදේශයන්ට පටහැණි මෙවැනි වාර්තාකරණයන් ඔස්සේ, අනුකාරක සිදුවීම් වලට මග පෑදීමේ හැකියාවක් ඇතැයි ඔබ නොසිතන්නේ ද?
ඔබේ අදහස?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
මූලාශ්‍ර:
https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...
https://media.samaritans.org/.../Samaritans_Ireland_media...
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...